# හොඳම ගෙදර



ඒ. ඒ සෙනුජි බුහන්සා බණ්ඩාර

# හොඳම ගෙදර

ඒ. ඒ සෙනුජි බුහන්සා බණ්ඩාර

කතෘ

මහාමායා බාලිකා විද්‍යාලය

7 ශ්‍රේණිය F

2026.05.10

978 – 624 – 211 – 270 - 1



# පිදුම

***පොත් පිටු අතරේ හීන මාලිගා හදන හැම පුංචි කියවන්නෙකුට ම මේ කතාව පුදමි***

µµµ



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදනම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දයාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට

ජයග්‍රහනයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුනතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. පේ සදහා නිර්මාණ කරණයෙන් දායක වූ පාසල් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි.මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත්බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යමපළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය
විශ්වවිද්‍යාලය.
2026 ජූනි මස 10 වැනිද

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

2026.05.10



# <u>හොඳම ගෙදර</u>

ඔන්න එකමත් එක රටක ඉතා විශාල හා ලස්සන කැලෑවක් තිබුණා. ඒ කැලෑවේ ගොඩක් සත්තු

සතුටින් හා සාමයෙන් ජීවත් වුණා.






ඔන්න එක දවසක් ඉබි හාමිට එයා ගැනම දුක හිතුනා. හ්ම් කැලෑවේ ඉන්න හැම සතෙක්ටම එයාලගෙම කියලා ගෙවල් තිබුණා.බඩු මුට්ටු

තියාගන්නත් පුළුවන් . ඒත් ඉතින් මගේ ගෙදර කිසි ලස්සනක් නෑ. බඩු මුට්ටු තියා ගන්නත් බෑනේ ඉබි හාමි කල්පනා කළා. ඔන්න එක දවසක් ඉබිහාමි උදෙන්ම නැගිටලා ගෙයක් හදන්න සූදනම් වුණා. ඉතින් ඉබිහාමි මුලින්ම කපුටු හාමිගේ ගෙදර දිහා හොදට බැලුවා.



හ්ම්, කපුටු හාමි වගේ ගේ හදන්නත් පුළුවන්. ඒත් ඉතින් ගහට නගින්න බහින්න බෑනේ. ඊට පස්සේ ඉබි හාමි සෙමින් සෙමින් හා පුංචාගේ ගෙදරට ගියා. හාපෝ බැරි වෙලාවකවත් පස් ටික කඩන් ආවොත් මුළු ගෙදරම පස් වලට යට වෙයි.



ඉබි හාමිට හිතා ගන්න බෑ කොහොම එයාගේ ගෙදර හදන්නද කියලා. ඔන්න ඉතින් ඉබි හාමි තවත් සතෙක්ගේ ගෙදරක් හොයන් ඇවිද්ද.

03

ඔහොම ඇවිදගෙන යද්දී ඉබිහාමි දැක්කා අන්දකාරයෙන් පිරිච්ච ගල් ගුහාවක්. ඉබි හාමි

තරමක් බියෙන් වුණාත් එය ඇතුළට ඇවිද්ද.



ගුහාව ඇතුළේ කවුරුත්ම පේන්න හිටියේ නෑ. ඒත් සත්තුන්ගේ ඇට කටු ටිකක් නම් පේන්න තිබුණා.

මම හිතන්නේ මෙතන ඉස්සර සත්තු වළලපු තැනක්. අනේ මම ඔය හොල්මන් වලට බය කෙනෙක් නෙවෙයි.




මොකටද ආය අලුතින් ගෙවල් හදන්නේ මේ තියෙන්නේ හොඳ ගෙදරක්. අද ඉදන් මම මේ ගුහාවේ ජීවත් වෙනවා.


මේ තියෙන්නෙ හොඳ ගෙදරක්!

ඔන්න ඉතින් ඉබ් හාමි වෙනදට වඩා සතුටින් සහ ආඩම්බරයෙන් කාලය ගත කළා. ඔන්න එක දවසක් ඉබ් හාමිට හිතුනා එයාගේ පරණ ගෙදර බලන්න යන්න. ඉතින් ඉබ් හාමි ඉබ් කට්ට ඇතුළට ඔලුව දැම්මා. ඊට පස්සේ ඔලුව එළියට ගන්න බැරිව කැලෑ දෙස්තරගෙන් බෙහෙතුත් ගන්න වුණා. අද වෙනකොට ඉබ් හාමි ගුහාවට ඇවිල්ලා හරියටම මාස දහයයි. ඉබ් හාමි හිටියේ හොද නින්දක.



මොකක්දෝ සද්දයක් ඇහිලා ඉබි හාමි ඇහැරුනා. ඉබි හාමි දැක්කා යම් හෙවනැල්ලක් ගුහාවට එනවා.



ටිකෙන් ටික චායාව පැහැදිලිව පෙනෙන්න ගත්තා. එතන හිටියේ උල් දත් හා දිග නියපොතු තියෙන නරියෙක් .නරියා ඉබි හාමිව දැකලා වේගයෙන් දුවගෙන ආවා.



ඉබි හාමි කටුව ඇතුලට රිංගන්න උත්සහ කළත් ඉබි හාමිට එය බැරි වුණා. ඒත් අන්තිමේ දී නරියා ළගට එන්නට කළින් ඉබි හාමි ඉබිකට්ට ඇතුලට

රිංගුවා. නරියා ඉබ්කට්ට හැපුවත් එය කැඩුනේ නම් නෑ.





නරියා බොහෝ වේලාවක් එතන හිටියත් ඉබ්බා එළියට ආවේ නැති නිසා වෙනත් ගොදුරක් අල්ලන

බලාපොරොත්තුවෙන් නරියා එතනින් යන්න ගියා. ඉන් පසු ඉබි හාමි වෙනදා මෙන් ඉබි කට්ට ඇතුලේ ජීවත් වුණා. එදා සිට ඉබි හාමි තේරුම් ගත්තා අපි **ලද දෙයින් සතුටු විය යුතු බව**.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළ යුතු බව පර්යෙෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් විම වළක්වා ගන්නට

මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පතිනිය,ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළද මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)